# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 866/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/05/2024<br>පැය 1430 |

**මාධ්‍ය නිවේදනය**

**මිනුවන්ගොඩ රාජමහා විහාරස්ථානයේ වෙසක් මහා පෙරහැර - රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව.**

මිනුවන්ගොඩ රාජමහා විහාරස්ථානය මඟින් පවත්වනු ලබන වාර්ෂික වෙසක් මහා පෙරහැර 2024.05.23 වන දින පැවැත්වීමට නියමිතව ඇත.

මෙම පෙරහැර මිනුවන්ගොඩ නගරය ආවරණය කරමින් විදී සංචාරය කරන අතර කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපොල වෙත විශාල වශයෙන් මහජනයා පැමිණීම හා පිටවීම ද මිනුවන්ගොඩ නගරය හරහා සිදු වේ. එබැවින් මිනුවන්ගොඩ නගරය හරහා දිවෙන කොළඹ කුරුණෑගල මාර්ගය හා කටුනායක මහනුවර මාර්ග හරහා පෙරහැර ගමන් කිරීම නිසා දැඩි රථවාහන තදබදයක් ඇති වේ.

ඒ අනුව පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුල නියමිත ප්‍රදේශයේ රථවාහන ගමනාගමනය සීමා කරන අතර එම කාලය තුළ මිනුවන්ගොඩ නගරය හරහා ගමන් කිරීමට අපේක්ෂිත රියදුරන්ට හා මහජනතාවට පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

විකල්ප මාර්ග

- ❖ කුරුණෑගල දෙස සිට කොළඹ දෙසට ගමන් කරන රථවාහන නිල්පනාගොඩ හන්දියෙන් අලුතැපොල හරහා කටුනායක දෙසට ගමන් කල හැක.
- ❖ කොළඹ දෙස සිට කුරුණෑගල දෙසට ගමන් කරන රථවාහන අඹගහවත්ත හන්දියෙන් වීදිය වත්ත හරහා යකහටුව හන්දියෙන් දිවුලපිටිය දෙසට ගමන් කල හැක.
- ❖ නිට්ටඹුව දෙස සිට කටුනායක දෙසට ගමන් කරන රථවාහන යකහටුව හන්දියෙන් වීදිය වත්ත හරහා අඹගහවත්ත හන්දියෙන් ඇලිස්පාක් හරහා කටුනායක දෙසට ගමන් කල හැක.
- ❖ කටුනායක දෙස සිට නිට්ටඹුව දෙසට ගමන් කරන රථවාහන පවුස් අසලින් සතොස හන්දිය හරහා කුරුණෑගල පාර දෙසට පැමිණ පොල්මැස්ස හන්දියෙන් වේයන්ගොඩ මාර්ගය දෙසට ගමන් කල හැක.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.